ශීර්ෂය - 304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**ශීර්ෂය-304** කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පින්ඩන වාර්තාව 2024 මැයි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය වෙත සමාලෝචිත වර්ෂයේ ලැබුණු අග්‍රිමයෙන් රු.631,439 ක මුදලක් ප්‍රසම්පාදන කටයුතු ඇතුළු කාර්යයන් සැලසුම් කර පරිදි සිදු කිරීමට නොහැකිවීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී මහා භාණ්ඩාගාරයට හරවා යැවීමට සිදු වී තිබුණි. | ඉතිරිව තිබූ රු.631,429 ක වටිනාකම භාණ්ඩාගාරය වෙත යවා ඇති බව . | භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් නිසි පරිදි උපයෝජනය කල යුතුය. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව ඇප තැන්පත් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී විධිමත් ඇපතැන්පත් ලේඛනයක් පවත්වා නඩත්තු කිරීමට කටයුතු කරන බව . | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැන්පත් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 30 ක මුළු ප්‍රතිපාදනයද, තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට 99.5 දක්වා පරාසයක රුපියල් මිලියන 38.37ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි. | බලාපොරොත්තු වූ පරිදි වියදම් උද්ගත නොවීම, දූරස්ථ පුහුණු මධ්‍යස්ථාන වලට රැගෙන ගොස් ලබා දෙන පුහුණු වැඩ සටහන් අත්හිටුවීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුන බව . | භාණ්ඩාගාර ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූ.රෙ.66/69 මාරු කිරීම් මගින් වැය විෂයයන් 04 කට අදාල මූලික ප්‍රතිපාදනයෙන් සියයට 70 සිට සියයට 400 දක්වා පරාසයක් තුල වැඩිකර ගැනීමක් හෝ අඩුකර ගැනීමක් හා වැය විෂයයන් 3ක මූලික ප්‍රතිපාදනයට පරිපූරක ඇස්තමේන්තු මගින් සියයට 67 සිට සියයට 153 දක්වා පරාසයක වැඩි කර ගැනීමක්ද සිදුව තිබීම හේතුවෙන් අයවැය ඇස්තමේන්තු තාත්වික පදනමකින් හා නිසි පුරෝකථනයකින් තොරව සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. | බලාපොරොත්තු වූ පරිදි වියදම් උද්ගත නොවීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු බව | අයවැය ඇස්තමේන්තු තාත්වික පදනමකින් හා නිසි පුරෝකථනය කින් සිදු කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දී ඇති උපදෙස් අනුව කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීතිරීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| | 16(2) උපවගන්තිය | මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කල යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සඳහන් කර ඇති ආකාරයට ඉදිරියේදී කටයුතු කරන බව. | විගණන පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XV පරිච්ඡේදයේ 10.4 සහ 10.10 වගන්ති | අනුග්‍රාහක විදේශ ආයතනයකින් ප්‍රදානය කරන අධ්‍යනයක්, පුහුණු පාඨමාලාවක්, ශිෂ්‍යත්වයක්, සම්මන්ත්‍රණයක් හෝ වැඩමුළුවක් වැනි කරුණක් සඳහා විදේශ ගතවීම් සම්බන්ධයෙන් 16 වැනි පරිශිෂ්ඨය පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්‍රවල අතිරේක පිටපතක් සහ නිලධාරියාගේ විදේශ නිවාඩු අනුමත කිරීමේ ලිපියේ පිටපතක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 09 කගේ විදේශ ගමන් 11ක් සම්බන්ධයෙන් ඉහත විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විදේශ ගමන් සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයට ලිපි ඉදිරිපත් කිරීම නැවැත්වීමෙන් පසුව දිගටම 16 වැනි පරිශිෂ්ඨය පරිදි සම්පූර්ණ කල අයදුම්පත්‍රයේ අතිරේක පිටපතක්ද, නිලධාරියාගේ නිවාඩු අනුමත කිරීමේ ලිපියේ පිටපතක්ද විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර නොමැත. මින් ඉදිරියට ආයතන සංග්‍රහයේ උපදෙස් පරිදි කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 565 (5) | එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයේ පිළියෙල කල මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | 2024 අප්‍රේල් මස සිට මෙම වාර්තාව සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571 (2)(3) | අවුරුදු 02 ඉක්මවූ තැන්පතු එකතුව රු.348,933ක් අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු සඳහා මු.රෙ.571 අනුව නිරවුල් කිරීමට කටයුතු කෙරෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008-1.4 XVIII වගන්තිය | ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කර තිබුණද ප්‍රඥප්තිය පිළියෙල කරන අවස්ථාවේදී ඉටු කල යුතු අවශ්‍යතා වන කාර්යාල පරිශ්‍රය තුල හා නිල වෙබ් අඩවිය තුල ප්‍රදර්ශනය කිරීම හෝ අඩුම තරමින් මාස 06කට වරක් සමාලෝචනය කිරීමක් හෝ සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කටයුතු ආරම්භ කර ඇත. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති තොරතුරු ආපදා කළමනාකරණ අංශය වෙත ලබා දී ඇත. ඒ අනුව ප්‍රඥප්තිය පිළියෙල කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | 2017 අප්‍රේල් 19 දිනැති අංක 3/2017, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2001 අගෝස්තු 07 දිනැති 15/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කිරීමකින් තොරව 2023 වර්ෂයට අදාළව 1/20 දීමනාව හා අතිකාල ගෙවීම් වශයෙන් රු. 24,941,323ක මුදලක් ගෙවීම් කර තිබුණි. | මෙම තත්වය පාලනය කිරීම පිණිස පවත්නා ප්‍රතිපාදන සීමාව මත ආරම්භයක් වශයෙන් ප්‍රාදේශීය කාර්යාල සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමට පියවර ගෙන ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.94,830ක ආපදා ණය සහ රු.27,000 ක වාහන ණය 2010 ජූලි 08 දින සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය නොගෙවීම සම්බන්ධයෙන් මෙම නිලධාරියාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා 2024 පෙබරවාරි 09 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපිගොනු යවා ඇති බව. | නිලධාරීන්ගේ ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම විගණනයට 2023 ජූනි 15 දින ඉදිරිපත් කර තිබුණු අතර එය සංශෝධිත අයවැය ප්‍රතිපාදනවලට අනුගතව සකසා ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව මුළු ප්‍රතිපාදනය රුපියල් මිලියන 493.1ක් වූ අතර සංශෝධිත අයවැය අනුව ප්‍රතිපාදනය රුපියල් මිලියන 515.1ක් විය. | පාර්ලිමේන්තුවේ සම්මත අයවැය අනුව 2023 වර්ෂය වෙනුවෙන් අනුමත කරන ලද මූලික ඇස්තමේන්තුව අනුව 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබූ අතර 2023 ජූනි 15 දින විගණනයට ඉදිරිපත් කර ඇත්තේ එම ක්‍රියාකාරී සැලැස්ම වේ. ඉන් අනතුරුව සමහර වැය විෂයයන් සඳහා අතිරේක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් අනුමත කර ලබාගන්නා ලද බව. | සංශෝධිත අයවැය ප්‍රතිපාදනවලට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම සකස් කල යුතුය. |
| (ආ) | ආයතනයේ 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මේ ඇතුළත් Under CRESMPA Modernization Project යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඒ සම්බන්ධ තොරතුරු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | නවීකරණ ව්‍යාපෘතිය (CResMPA) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2021-2025 පස් අවුරුදු සංයුක්ත සැලැස්මේ ඇතුළත්ව තිබූ නමුත් එම ව්‍යාපෘතිය සම්බන්ධ තොරතුරු හා එහි ප්‍රගතිය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති බවත් 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මටද අතපසුවීමකින් ඇතුලත් කර නොමැත. මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සංයුක්ත සැලැස්මේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඒ සම්බන්ධ තොරතුරු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කල යුතුය. |

### 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන කාර්යයන් 06 ක් සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 15.6 ක මුදලක් පිරිවිතර ලබාගැනීමට නොහැකි වීමෙන් අවලංගු කර තිබුණි. | පිරිවිතර ලබාගැනීමට නොහැකි වීමෙන් අවලංගු කර ඇති බව. | ප්‍රසම්පාදන සැලසුමට අනුව කාර්යයන් සිදු කිරීමට කටයුතු කල යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජපන් ආධාර යටතේ (JICA) 2008 වර්ෂයේදී ලැබී තිබූ රුපියල් මිලියන 570 ක් වටිනා ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 38 න් 35 ක් මගින් උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, වර්ෂාපතනය, සුළගේ වේගය හා දිශාව, පීඩනය, සූර්ය විකිරණ ප්‍රමාණය යන පරාමිතීන් මනිනු ලබන අතර ඉතිරි පද්ධති 03 විගණිත දිනය වූ 2023 මැයි 31 දින වනවිටත් කටුනායක ගුවන්තොටුපල, ත්‍රිකුණාමලය, මාලිබොඩ යන ස්ථානවල සවිකිරීමට කටයුතු කර නොතිබූ බැවින් අධික වටිනාකමක් සහිත උපකරණ ඌණ උපයෝජිතව පැවතීමට ඉඩහැරීම හේතුවෙන් අවශ්‍ය පහසුකම් ලබාගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව. | අධික වටිනාකමක් සහිත උපකරණ නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සවිකර ඇති ස්වයංක්‍රීය කාලගුණ පද්ධති 35 න් 14 ක පමණක් GPRS තාක්ෂණය යටතේ නියමිත පරිදි දත්ත ආයතනයට ලැබෙන අතර මධ්‍යස්ථාන 10 ක බැටරිවල ආයුකාලය අවසන් වීම නිසා අක්‍රියව පැවතුණි. හදිසි කාලගුණ වෙනස්වීම් තත්ත්වයන්හිදී ස්වයංක්‍රීය දත්ත ලබාගැනීමේ හැකියාව ඉතා වැදගත් වන අතර මේ හේතුවෙන් පද්ධති ස්ථාපිත කිරීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණ හා එකඟ වන බව. | ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතින ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන පිළිබඳ සොයා බලා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිවයින පුරා සාම්ප්‍රදායික වැසි මාපක 453 ක් සවිකර පවතින අතර ඒවායේ වර්තමාන ක්‍රියාකාරීත්වය හා දත්ත ලැබීම් අනුව වැසි මාපක 44 කින් විධිමත් පරිදි නඩත්තු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් දත්ත අඛණ්ඩව නොලැබෙන බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණ හා එකඟ වන බව. | අඛණ්ඩව දත්ත නොලැබෙන වැසි මාපක සඳහා විධිමත් නඩත්තු ක්‍රමවේදයක් ස්ථාපිත කර අඛණ්ඩව දත්ත ලැබෙන පරිදි පවත්වා ගත යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය වර්ෂාමාන 122 ක් පවතින අතර 2023 මැයි 31 දිනට වර්ෂාමාන 70 ක් පමණ ක්‍රියාත්මකව පැවතුණි. ඒ අනුව වර්ෂාමාන 52 ක් අක්‍රීය වී තිබුණු අතර 2023 නොවැම්බර් 30 දිනට නඩත්තු කටයුතු සිදු කර තිබුණේ වර්ෂාමාන 36 ක පමණි. | නිරීක්ෂණ හා එකඟ වන බව. | අක්‍රිය වර්ෂාමාන ක්‍රියාකාරී තත්ත්වයට පත් කර නිසි පරිදි නඩත්තු කල යුතුය. |
| (ඉ) | දෙපාර්තමේන්තුව සතු පිරිවැය රු.1,985,000ක් වූ කැබ් රථයක් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වර්ෂ 06 ක් පුරා අළුත්වැඩියාවන් සිදු කර භාවිතයට ගැනීමකින් තොරව ධාවනයෙන් ඉවත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රක්ෂණ ගාස්තු ලෙස රු.30,117ක මුදලක්ද ගෙවා තිබුණි. | කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා මිල ගණන් කැඳවා ඇත. මිල ගණන් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය 2024.04.30 දින වේ. ඉදිරිපත් කර ඇති මිල ගණන් සලකා බලා එදිනට පසුව රථයේ අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන බව. | වාහන නිසි පරිදි අළුත්වැඩියා කර ධාවනය සඳහා යොදා ගත යුතුය. |

### 3.4 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක සන්නිවේදක නිලධාරීන් සඳහා කොත්මලේ පිහිටි වාරිමාර්ග හා ජල කළමනාකරණ අන්තර්ජාතික පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහනට සහභාගී වූ නිලධාරීන්ට අවශ්‍ය ආහාර, පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් පරිදි සැපයීමට අදාල ආයතනය විසින් කටයුතු කර නොතිබීම හේතුවෙන් වැඩසටහන මගින් බලාපොරොත්තු වූ සේවක අභිප්‍රේරණය ඉටු වී නොතිබුණ අතර ඒ සඳහා දරන ලද රු.415,800ක වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය වූ අතර ඉහත හේතුන් මත පැවැත්වීමට සැලසුම් කර තිබූ දෙවන වැඩසටහනට | නිරීක්ෂණ හා එකඟ වන බව. | ආයතනය විසින් ලබාදෙන පාඨමාලාවලට නිලධාරීන් සහභාගිවීම සහ ඒවා නිසිපරිදි සම්පූර්ණ කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම, නිසි සැලසුමකට අනුව පුහුණු පාඨමාලා පැවැත්වීම සිදු කල යුතුය. |

ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් සහභාගී නොවීමෙන් අවලංගු කිරීමටද සිදු වී තිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඩොප්ලර් රේඩාර් පද්ධති පුත්තලම හා පොතුවිල් කාලගුණ මධ්‍යස්ථාන භූමියේ ස්ථාපනය කිරීම සඳහා 2019 සිට 2022 වර්ෂය වන විට රුපියල් මිලියන 563.58 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2023 වර්ෂය අවසානය වන විට වියදම රුපියල් මිලියන 0.462ක් පමණක් වී තිබුණි. ගිවිසුම්ගත වී වසර 05 ක් ගත වී ඇතත් රේඩාර් පද්ධති ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේදී අවසන් අදියර වෙත ළඟාවිය යුතු වුවද, වර්තමානයේ මිල ගණන් ඉහළයාම නිසා ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.<br>කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවක් පැවතියද, වර්ෂ 15 කට ආසන්න කාලයක් එම පද්ධතිය නොමැතිව කාලගුණ විද්‍යා අනාවැකි හා පුරෝකථන ලබා දී තිබීමෙන් එහි නිරවද්‍යතාවයට වඩාත් ලංවීම හා විශ්වසනීයත්වයෙන් යුතුව පුරෝකථන හා අනාවැකි නිකුත් කිරීමට කටයුතු සැලසේද යන්න නිශ්චය කිරීමට නොහැකි විය. | ඩොප්ලර් රේඩාර් පද්ධති පැවතීම කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී නිවැරදි දත්ත ලබා ගැනීමට පිටුවහලක් වුවද එය අනාවැකිකරණය සඳහා දත්ත ලබා දෙන්නා වූ එකම ක්‍රමවේදය නොවේ. මෙම දෙපාර්තමේන්තුවේ , පවත්නා සීමිත සම්පත් සහ ප්‍රතිපාදන මත සහ දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි තත්වයන් හමුවේ කාලගුණ විද්‍යා අනාවැකි හා පුරෝකථන සපයමින් දේශගුණ විපර්යාස පූර්වයෙන් හඳුනාගෙන විශ්වසනීයත්වයෙන් යුතුව අනාවැකි සපයා දී ඇති බවත්, එමඟින් ශ්‍රී ලංකාව පාරිසරික විපත් රාශියකින් මුදවා ගැනීමට කටයුතු කර ඇති බවත් කාරුණිකව දැනුම්දෙන බව. | මේ අනුව කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවක් පවතින අතර මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | රේඩියෝසොන්ඩ් උපකරණය මඟින් ඉහළ සුළං නිරීක්ෂණය, වායු පීඩන උෂ්ණත්වය, ආර්ද්‍රතාව, සුළඟේ වේගය හා සුළඟේ දිශාව ඉහළ වායු නිරීක්ෂණ දත්ත ලබාගනු ලැබුවද නිසි සැලසුමකට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීමෙන් 2022 වර්ෂයේ යැවිය යුතු වාර 156 න් 141 ක් සහ 2023 වර්ෂයේ අගෝස්තු 31 දක්වා සිදුකල යුතු වාර 104 න් 83 ක් ඉහළ වායුගෝල නිරීක්ෂණ දත්ත ලබාගෙන නොතිබුණි. 2022 වර්ෂයේ සිට රේඩියෝසොන්ඩ් නිරීක්ෂණය නොකල වාර සංඛ්‍යාව, ආසන්න වශයෙන් සිදුකල යුතු සංඛ්‍යාවෙන් සියයට 86 ක් පමණක් වී තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වන බව. | ඉහළ වායුගෝලයේ නිරීක්ෂණ දත්ත රේඩියෝසොන්ඩ් බැලූනයෙන් දෙපාර්තමේන්තුවේ නියමිත ක්‍රියාවලිය පරිදි ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පහළ මට්ටමේ සිට මධ්‍යම මට්ටම දක්වා සුළඟේ වේගය හා දිශාව මැනීම සඳහා නියමු බැලුන් නිරීක්ෂණ මධ්‍යස්ථාන 04ක දෙපාර්තමේන්තුවේ නියමිත ක්‍රියාවලිය පරිදි සෑම දිනකම වේලාවන් 03කදී නිරීක්ෂණය සිදුකල යුතු වුවද, ඒ සඳහා අවශ්‍ය නියමු බැලූන් 4000 ක් ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සැලසුම් සහගතව සිදු නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේ සිදු කල යුතු නිරීක්ෂණ වාර නියමිත පරිදි සිදුකර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව. | පහළ මට්ටමේ සිට මධ්‍යම මට්ටමේ නිරීක්ෂණ දත්ත නියමු බැලුන් මගින් දෙපාර්තමේන්තුවේ නියමිත ක්‍රියාවලිය පරිදි ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | රේඩියෝසොන්ඩ් හා නියමු බැලුන් පිරවීම සඳහා හයිඩ්‍රජන් වායුව යොදා ගන්නා අතර, කොළඹදී හයිඩ්‍රජන් වායුව නිපදවා ගැනීම සඳහා හයිඩ්‍රජන් ජෙනරේටරය යොදාගනු ලබයි. හයිඩ්‍රජන් නිෂ්පාදන ක්‍රියාවලිය ඉතා අනතුරුදායක වුවද, හයිඩ්‍රජන් නිෂ්පාදනයේදී හා බැලූම යවන අවස්ථාවලදී එම නිලධාරීන් ආරක්ෂිත ඇඳුම්වලින් යුක්ත නොවීම, හයිඩ්‍රජන් නිෂ්පාදනාගාරය ආසන්නයේ වාහන ගාල් කිරීම සහ වාහන නිතර පනගැන්වීම සිදු කිරීම වැනි අනාරක්ෂිත ක්‍රියාවන් සිදුවන බව කොළඹ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | නිරීක්ෂණ හා එකඟ වන බව. | හයිඩ්‍රජන් නිෂ්පාදන ක්‍රියාවලිය ඉතා අනතුරුදායක බැවින් ඒ සඳහා ආරක්ෂිත පියවර අනුගමනය කල යුතුය. |
| (ඉ) | ගුවන් ගමන් සඳහා අවශ්‍යවන කාලගුණික දත්ත සැපයීම අරමුණු කරගෙන රත්මලාන ගුවන්තොටුපල ආශ්‍රිතව පිහිටුවා තිබූ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ කාලගුණ දත්ත ලබා ගැනීම, ඒවා සන්නිවේදනය සඳහා වූ උපකරණ නඩත්තුව ආදී කරුණු පිළිබඳව කරන ලද සෝදිසි පරීක්ෂාවේදී ලෝක කාලගුණ විද්‍යා සංගමයේ මාර්ගෝපදේශ අනුව උපකරණ කොටුව සකස් කර නොතිබීම, ක්ෂණික සුළං ප්‍රහාර, එහි වේගය හා දිශාව පරීක්ෂා කිරීමට පැවතිය යුතු Gust Recorder යන්ත්‍රය වසර ගණනාවක සිට ක්‍රියාවිරහිත තත්ත්වයේ පැවතීම, කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාලයට සම්ප්‍රේෂණය වන පරිගණක පද්ධතිය 2019 වර්ෂයේ සිට අක්‍රීයව පැවතීම, උපකරණ කොටුව තුළ උෂ්නත්වමාන ගබඩාකර ඇති පෙට්ටිවල කණු දිරාපත් වීම යන කරුණු නිරීක්ෂණය විය. | නිරීක්ෂණ හා එකඟ වන බව. | ලෝක කාලගුණ විද්‍යා මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අනුරාධපුරය,මඩකලපුව, කටුගස්තොට, මහඉලුප්පල්ලම, මන්නාරම, රත්නපුර, කුරුණෑගල, වව්නියාව, මුලතිව් යන කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටි භූමි ප්‍රදේශ 09 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව. | අදාල භූමි ප්‍රදේශ දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 462 ක් වන අතර සත්‍ය සේවක සංඛ්‍යාව 349 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 113 කි. එයින් පුරප්පාඩු 16ක් ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ තනතුරු 04ක්, කාලගුණ විද්‍යාඥ තනතුරු 08ක් හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු තනතුරු 02ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුරුවල කාර්යයන් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට ඉමහත් දායකත්වයක් සපයන බැවින් එකී තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීමට ක්‍රියා නොකිරීමෙන් ආයතනයේ කාර්යසාධනය, අරමුණු හා කාර්යයන් නිසි ලෙස පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. | ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16ක් පුරප්පාඩුව ඇති අතර එම තනතුරු පිරවීමට ඉදිරි කටයුතු කරමින් පවතින බව. | දෙපාර්තමේන්තුවේ පවතින මූලික තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |